මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ
පරිවාස නිළධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය

16 OCT 2015

1. සම්බන්ධ වන ආයතන:-

 1.1. දෙපාර්තමේන්තුව:- මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව
 යොමු අංකය:CPC/Sp/1/4/10-2 දිනය: 2015.07.17

 1.2. අමාත්‍යාංශය:- මධ්‍යම පළාත් සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභසාධන සහ පරිවාස හා ළමාරක්ෂක සේවා අමාත්‍යාංශය.
 යොමු අංකය:CPC/HM/HR/10/03/45 දිනය:2015.07.22

 1.3. මධ්‍යම පළාත් ප්‍රධාන ලේකම්ගේ නිර්දේශය:
 යොමු අංකය:CPC/CS/01/04/15 දිනය:2015.08.21

2. ක්‍රියාත්මක වන දිනය:- 1987 අංක 42 දරන පළාත් සභා පනතේ 32 වගන්තිය අනුව මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිළධාරීන් හා පරිවාස නිළධාරීන්ගේ සේවයේ වාර්ෂික ස්ථාන මාරු සඳහා වූ මෙම පරිපාටිය මධ්‍යම පළාත් ගරු ආණ්ඩුකාරතුමා අනුමත කරන ලද දින සිට ක්‍රියාත්මක වේ.

3. මෙම ස්ථාන මාරු පරිපාටිය මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පරිවාස නිළධාරීන් මධ්‍යම පළාත තුළ අධිකරණ කලාප අතර ස්ථාන මාරු කිරීම සඳහා අදාළ වන වාර්ෂික ස්ථාන මාරු පරිපාටිය වේ.

4. මෙම ස්ථාන මාරු පරිපාටියට අනුව අමාත්‍යාංශ ලේකම් විසින් පත් කරනු ලබන ස්ථාන මාරු මණ්ඩලයක් මගින් වාර්ෂික ස්ථාන මාරු සඳහා කැඳවනු ලබන අයැදුම්පත් සහ අදාළ අනෙකුත් විස්තර සළකා බලා ඉදිරිපත් කරනු ලබන නිර්දේශ මත මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් විසින් ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කරනු ලැබේ.

5. වාර්ෂික ස්ථාන මාරුවලින් පරිබාහිරව අනුමත කාර්ය මණ්ඩලයේ සේවක සංඛ්‍යාව නොඉක්මවන පරිදි පහත දැක්වෙන හේතු මත ස්ථාන මාරුවක් කළ යුතු යැයි අමාත්‍යාංශ ලේකම්/ දෙපාර්තමේන්තු ප්‍රධානියා අදහස් කරන විට ඒ සඳහා ඔහුට බලය පැවරේ. එවැනි ස්ථාන මාරුවීමකින් අතෘප්තිමත් වන සේවකයන් හට මධ්‍යම පළාත් අමාත්‍යාංශ ලේකම් වෙත අභියාචනා කිරීමට හැකිවේ.

 5.1. සේවා අවශ්‍යතාවය මත
 5.2. අන්‍යෝන්‍ය ස්ථාන මාරු මත
 5.3. පත්කළ රජයේ වෛද්‍ය මණ්ඩලයක නිර්දේශ මත
 5.4. සේවා ස්ථානයේ වෙනසක් නොවන මාරුකිරීම
 5.5. විනය හේතූන් මත

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/09... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

6. වාර්ෂික ස්ථාන මාරුවීම්

 6.1. ස්ථාන මාරුවීම අපේක්ෂා කරන සේවකයන්ගේ ඉල්ලීම් ඉටු කිරීම සඳහා වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලය ක්‍රියාත්මක කෙරේ.

 6.2. මාරු මණ්ඩලය ස්ථාපනය කිරීම.

 දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන සහකාර කොමසාරිස් (පරිවාස) විසින් සභාපතිත්වය දරනු ලබන ත්‍රිපුද්ගල කමිටුවක් විසින් වාර්ෂික ස්ථාන මාරු පිළිබඳව තීරණය කරනු ඇත. එම කමිටුවේ සහකාර කොමසාරිස්ට අමතරව පහත නිලධාරීන් ඇතුළත් විය යුතුය.

6.2.1. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවක මාණ්ඩලික නිලධාරියෙක්
6.2.2. අමාත්‍යාංශය/දෙපාර්තමේන්තුවක පරිපාලන නිලධාරි

6.3. ස්ථාන මාරුවීම්වලදී සලකා බැලිය යුතු පොදු ප්‍රතිපත්ති පහත පරිදි වේ.

6.3.1. වාර්ෂික ස්ථාන මාරුවීම්වලදී සුදුසුකම් ලබන සේවා කාලය ගණනය කරනු ලබන්නේ පවත්නා වර්ෂයේ දෙසැම්බර් 31 දිනටය.

6.3.2. සේවා කාලය ගණනය කිරීමේදී අධිකරණ කලාපයක අඛණ්ඩව හෝ ඛණ්ඩව කළ සේවා කාලවල එකතුව මුළු සේවා කාලය ලෙස ගණන් ගනු ලැබේ.

6.3.3. යම් නිළධාරියකු එක් අධිකරණ කලාපයක වසර 03 ක සේවයේ නිරතව සිටිනම් අතිදුෂ්කර, දුෂ්කර හා ප්‍රියමනාප නොවන හා ප්‍රියමනාප සේවා ස්ථානයන්හි සේවා කාලය සම්පූර්ණ කළ සේවකයින්ට ස්ථාන මාරු ලබාදීමට හැකි වන පරිදි ඔහුගේ කැමැත්ත නොමැතිවද ස්ථාන මාරුවක් ලැබීමට යටත් වනු ඇත.

6.3.4. නියමිත කාලය සම්පූර්ණ කර ඇති විට වාර්ෂික ස්ථාන මාරු සඳහා අයැදුම් කිරීම නිළධාරියාගේ වගකීම වන අතර එසේ අයැදුම් නොකරන නියමිත සේවා කාලය සම්පූර්ණ කර ඇති නිලධාරීන් ස්ථාන මාරු මණ්ඩලයේ අභිමතය පරිදි පුරප්පාඩු ඇතිවන අධිකරණ කලාපයකට ස්ථාන මාරු කරනු ලැබේ.

6.3.5. ස්ථාන මාරුව ක්‍රියාත්මක වන දිනය ස්ථාන මාරුව ක්‍රියාත්මක වන වසරේ මාරු මණ්ඩලය තීරණය කරන දිනය වේ.

6.3.6. යම් සේවා ස්ථානයකට වෙනත් ඉල්ලීමක් නොමැත්තේනම් නියමිත සේවා කාලයට වඩා වැඩි වුවද එම සේවා ස්ථානවල සේවය කරනු ලබන නිලධාරීන්ට සිය කැමැත්ත පරිදි එම සේවා ස්ථානයේම සේවය කිරීමට ඉඩ සලසා දීම පිළිබඳව සලකා බැලිය හැකිය.

7. අධිකරණ කලාප අතර වාර්ෂික ස්ථාන මාරුවීම් සිදු කිරීමේදී අනුමත ස්ථාන මාරු පරිපාටියක් අනුව වාර්ෂික ස්ථාන මාරු මණ්ඩලයේ නිර්දේශ මත විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය ලබාගෙන ක්‍රියාත්මක කල යුතුය.

8. සේවා ස්ථාන වර්ගීකරණය

ස්ථාන මාරු ක්‍රියාවලිය සඳහා නිළධාරීන් සේවයෙහි යෙදී ඇති මධ්‍යම පළාත තුළ පවතින එක් එක් අධිකරණ කලාප පහත පරිදි වර්ග කරනු ලැබේ. (ඇමුණුම 01)

A වර්ගය - ප්‍රියමනාප
B වර්ගය - ප්‍රියමනාප නොවන
C වර්ගය - දුෂ්කර
D වර්ගය - අති දුෂ්කර

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

9. ස්ථාන මාරුවීම් සඳහා කාල සටහන **

| | | |
|---|---|---|
| 9.1. | ස්ථාන මාරුවීම් ඉල්ලීම් භාරගන්නා අවසාන දිනය | - අගෝස්තු 15 දිනට පෙර |
| 9.2. | මාරු කිරීමට තීරණය කරන ලද නිලධරයන්ගේ නම් ලැයිස්තුව ඒ ඒ නිලධරයන් වෙත දැනුම් දීම | - ඔක්තෝබර් 01 දිනට පෙර |
| 9.3. | ස්ථාන මාරු නියෝග ක්‍රියාත්මක කිරීම | - නොවැම්බර් 01 දිනට පෙර |
| 9.4. | අභියාචනා ඉදිරිපත් කල යුතු අවසන් දිනය | - ඔක්තෝබර් 15 දිනට පෙර |
| 9.5. | අභියාචනා තීරණ මත අවසාන ස්ථාන මාරුවීම් නියෝග නිකුත් කිරීම | - නොවැම්බර් 01 දිනට පෙර |
| 9.6. | ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම | - ජනවාරි මස 01 දිනට පෙර |

** මෙම කාල පරාසයට අනුකූලව දින වකවානු වෙනස් කිරීමේ බලය විෂය භාර අමාත්‍යාංශ ලේකම් සතුවේ.

10. ඇමුණුම 02 පරිදි ස්ථාන මාරු ඉල්ලුම්පත්‍රය ඉහත වගන්තියේ දැක්වෙන පරිදි එකී දිනයන්ට පෙරාතුව ඉදිරිපත් කළ යුතු වේ.

11. වාර්ෂික ස්ථාන මාරු ක්‍රියාත්මක කිරීම

11.1. ස්ථාන මාරු මණ්ඩලය විසින් ලැබී ඇති අයදුම්පත් හා අනෙකුත් විස්තර සලකා බලා සිය යෝජනා දෙපාර්තමේන්තු ප්‍රධානියා වෙත ඉදිරිපත් කළ යුතුය.

11.2. යෝජිත වාර්ෂික ස්ථාන මාරු වලින් අතෘප්තියට පත්වන නිලධාරීන් සිය අභියාචනා ඇමුණුම 03 අනුව සකසා තම ආයතන ප්‍රධානියා මගින් අභියාචනා මණ්ඩල සභාපති වෙත එවිය යුතුය.

11.3. අමාත්‍යාංශ ලේකම් විසින් අභියාචනා කමිටුව පත් කරනු ලබන අතර එය පහත සඳහන් පරිදි ජ්‍යෙෂ්ඨ නිලධාරීන් තිදෙනෙකුගෙන් සමන්විත වේ.

11.3.1. දෙපාර්තමේන්තුව අයත් වන අමාත්‍යාංශයේ ලේකම් විසින් පත් කරනු ලබන දෙපාර්තමේන්තු ප්‍රධානියා වන පළාත් කොමසාරිස්.

11.3.2. වෙනත් අමාත්‍යාංශයක හෝ දෙපාර්තමේන්තුවක මාණ්ඩලික නිලධාරියෙකු

11.3.3. ස්ථානමාරු මණ්ඩල සාමාජිකයෙකු.

11.4. මෙම අභියාචනා කමිටුව විසින් ඉදිරිපත්ව ඇති අභියාචනා සලකා බලා සිය නිර්දේශ අමාත්‍යාංශ ලේකම් වෙත ඉදිරිපත් කළ යුතුය. එම නිර්දේශ සඳහා පදනම් වූ හේතු ද එම වාර්තාවෙහි අඩංගු විය යුතුය. නියමිත දිනට පසු ඉදිරිපත් කරනු ලබන අභියාචනා ප්‍රතික්ෂේප කරනු ලැබේ.

11.5. වාර්ෂික ස්ථාන මාරු කමිටුවේ යෝජනා ද වාර්ෂික ස්ථාන මාරු අභියාචනා කමිටුවේ නිර්දේශ ද අදාළ විෂය භාර අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතියද සැලකිල්ලට ගෙන දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් වාර්ෂික ස්ථාන මාරු නියෝග නිකුත් කළ යුතුය.

11.6. වාර්ෂික ස්ථාන මාරු ලබන සියළු නිළධාරීන් නියමිත දිනට එම නියෝග පරිදි අදාළ බලධාරීන් වෙත රාජකාරියට වාර්තා කළ යුතුය.

12. වයස අවු 55 ට වැඩි නිළධාරියෙකු එකී නිළධාරියාගේ කැමැත්තක් නොමැතිව මෙම පරිපාටිය අනුව ස්ථාන මාරුවීම් වලට භාජනය නොවනු ඇත.

13. වාර්ෂික ස්ථානමාරු ක්‍රියා පරිපාටිය ආයතන සංග්‍රහයේ III වන පරිච්ඡේදයේ සඳහන් විධිවිධානවලට යටත්ව සකසා ඇත.

14. අර්ථ නිරූපන

14.1. "ආණ්ඩුකාරතුමා" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ ගරු ආණ්ඩුකාරතුමා/තුමිය වේ.

14.2. "අමාත්‍යාංශ ලේකම්" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සභාවේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා කටයුතු පිළිබඳ විෂය භාර අමාත්‍යාංශයේ ලේකම් වේ.

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

14.3. "ස්ථානමාරු පරිපාටිය" යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරීන්ගේ ස්ථාන මාරු පරිපාටිය වේ.

14.4. "දෙපාර්තමේන්තු ප්‍රධානියා/කොමසාරිස් " යනුවෙන් අදහස් කරනුයේ මධ්‍යම පළාතේ සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ කොමසාරිස්වරයා වේ.

15. පාලනය

15.1. මෙම වාර්ෂික ස්ථාන මාරු පරිපාටියෙහි විධිවිධාන සලසා නොමැති කරුණු පිළිබඳ අමාත්‍යාංශ ලේකම්ගේ අනුමැතිය මත දෙපාර්තමේන්තු ප්‍රධානියා විසින් තීරණය කරනු ලැබේ.

මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ නිර්දේශය:- නිර්දේශ කරමු.

01. ගාමිණී දසනායක මහතා (සභාපති ) ..................................

02. යූ .ඒ.බෝගහපිටිය මහතා (සාමාජික) ..................................

03. ජී.ජී.එස්.ඒ. දිසානායක මිය (සාමාජික) ..................................

04. වී. නන්දකුමාර් මහතා (සාමාජික) ..................................

05. ඒ.එම්.එම්.ජේ. නිස්තාර් මහතා (සාමාජික) ..................................

දිනය 2015-09-22

ආණ්ඩුකාර ලේකම්,

2015-09-22 දිනැති කොමිෂන් සභා වාර්තාවේ අංක 15/1125 යටතේ කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ පරිවාස නිලධාරි තනතුරේ ස්ථාන මාරු පරිපාටිය ගරු ආණ්ඩුකාරතුමියගේ අනුමැතිය සඳහා කාරුණිකව ඉදිරිපත් කරමි.

දිනය 2015.09.25

..........................................
ලේකම්
මධ්‍යම පළාත් රාජ්‍යසේවා කොමිෂන් සභාව

නිල මුද්‍රාව
ආර්. එම්. එන්. රත්නායක
ලේකම්
පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව
මධ්‍යම පළාත

අනුමත කරමි/නොකරමි
අනුමත කරමි/නොකරමි

..........................................
සුරංගනී එල්ලාවල
මධ්‍යම පළාත් ආණ්ඩුකාරවර
2015/10/05

දිනය 2015/10/05

ඇමුණුම - 01

සේවා ස්ථාන වර්ගීකරණය (අධිකරණ කලාප අනුව)

| අධිකරණ කලාපය | ප්‍රිය මනාප - A | ප්‍රිය මනාප නොවන - B | දුෂ්කර - C | අති දුෂ්කර - D |
|---|---|---|---|---|
| මහනුවර | මහනුවර | නාවලපිටිය | | |
| | ගම්පොල | තෙල්දෙනිය | | |
| | | | | |
| මාතලේ | මාතලේ | නාඋල | | |
| | | දඹුල්ල | | |
| නුවරඑළිය | නුවරඑළිය | | හැටන් | වලපනේ |

ඇමුණුම - 02

මධ්‍යම පළාත් සමාජ සුභසාධන පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ
පරිවාස නිළධාරි ස්ථාන මාරු අයැදුම්පත්‍රය

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/09 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

1. දැනට සේවය කරන අධිකරණ කලාපය :-..................................
   1.1. එම අධිකරණ කලාපය අයත් දිස්ත්‍රික්කය :-..........................
   1.2. අදාළ අධිකරණ කලාපයට පත් කල දිනය :-......................
2. නිළධාරියාගේ සම්පූර්ණ නම :-....................................................................................................
   2.1. ජාතික හැඳුනුම්පත් අංකය :-..........................................................
3. ස්ථිර පෞද්ගලික ලිපිනය :-.........................................................................................................
   3.1. දැනට පදිංචි ස්ථානයේ ලිපිනය :- ..........................................................................................
   3.2. දුරකථන අංකය :-..........................................
4. උපන් දිනය :-..............................................  වයස:-
   4.1. ස්ත්‍රී /පුරුෂභාවය :-...............................

| අවු: | මාස | දින |
|---|---|---|
| | | |

5. නිලධාරියා විවාහකද /අවිවාහකද යන බව :-..................................................................................
   5.1. දරුවන් පිළිබඳ තොරතුරු (අදාළ වේ නම්)

| දරුවන්ගේ නම | වයස | ඉගෙනුම ලබන පැසැල |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |

5.2. කලත්‍රයාගේ නම :-...................................................................................................
   5.2.1. කලත්‍රයාගේ සේවා ස්ථානය :-.......................................................................
   5.2.2. කලත්‍රයා ත්‍රිවිධ හමුදාවේ හෝ පොලිසියේ සේවයේ ක්‍රියාන්විත සේවයේ නියුතු ද?:-

5.2.3. එසේනම් ඔහු / ඇය අයත් වන සේවාව හා තනතුර:-..............................................
.........................................................................................................

5.3. පරිවාසනිලධාරි/පරිවාස නිලධාරි සේවයේ දැනට දරන තනතුර:- ..............................
5.3.1. දැනට සිටින පන්තිය හෝ ශ්‍රේණිය:-..........................................................
5.3.2. එම පන්තියට/ශ්‍රේණියට පත්වූ දිනය :-.......................................................
5.3.3. මුල් පත්වීම් දිනය:- ..................................................

6. සේවයට ඇතුළත් වූ දින සිට මේ දක්වා එක් එක් අධිකරණ කලාපවල සේවය කර ඇති සේවා විස්තරය. (අසම්පූර්ණ හා සාවද්‍ය තොරතුරු සැපයීම නොකළ යුතුය)

| අධිකරණ කලාපය | වර්ගීකරණය අනුව සේවා ස්ථානයේ වර්ගය (A,B,C,D) | | කාලසීමාව | | මුළු සේවා කාලය |
|---|---|---|---|---|---|
| | දිස්ත්‍රික්කය | ප්‍රා:ලේ:කො: | සිට | දක්වා | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |
| | | | | | |

7. ස්ථාන මාරුව ඉල්ලා සිටින අධිකරණ කලාපය:-
7.1. ..........................................................................
7.2. ..........................................................................
7.3. ..........................................................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/05 දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

8. ස්ථාන මාරු ඉල්ලීමට හේතු

8.1. ..........................................................................
..........................................................................

8.2. ..........................................................................
..........................................................................

8.3. ..........................................................................
..........................................................................

9. විශේෂයෙන් සඳහන් කිරීමට හේතු ඇත්නම්:-..............................................
..........................................................................
..........................................................................
..........................................................................

ඉහත දක්වා ඇති තොරතුරු සත්‍ය බව මම ප්‍රකාශ කරමි. මා විසින් ඉහතින් සඳහන් කර ඇති තොරතුරු අසත්‍ය බව ඔප්පු වුවහොත් මා හට විරුද්ධව විනයානුකූලව කටයුතු කළ හැකි බව මම දනිමි.

දිනය :-.................................                                        ...................................
නිලධාරියාගේ අත්සන

---

II කොටස

ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-............................                                        ................................
අත්සන හා නිල මුද්‍රාව

---

පළාත් කොමසාරිස්ගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-............................                                        ................................
අත්සන හා නිල මුද්‍රාව

ඇමුණුම - 03

නම:-.......................................................
තනතුර:-....................................................
ලිපිනය:-...................................................
.................................................
දිනය:-.....................................................

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/05.... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

...........................................................................මගින්,
...........................................................................අමාත්‍යාංශයේ ලේකම්.

<u>යෝජිත වාර්ෂික ස්ථාන මාරුව සම්බන්ධයෙන්</u>
<u>ඉදිරිපත් කරනු ලබන අභියාචනය</u>

ඔබගේ අංක ............................................................ හා .................................... දිනැති ලිපිය / යෝජිත වාර්ෂික ස්ථාන මාරු ලේඛනය මගින් මා..............................................................................................................................................ට ස්ථාන මාරු කිරීමට යෝජිත බව දන්වා ඇත. / අයැදුම්පත ප්‍රතික්ෂේප වී ඇති බව දන්වා ඇත. / මවිසින් ඉදිරිපත් කළ ............................................ දිනැති ස්ථානමාරු අයැදුම්පත්‍රය අනුව ස්ථානමාරු ලබාදී නොමැත.

02. පහතින් විස්තර කරනු ලබන කරුණු මත එම යෝජිත ස්ථානමාරුව, අවලංගු කර දෙන ලෙස / සංශෝධනය කර දෙන ලෙස /නැවත සලකා බලන ලෙස / ප්‍රතික්ෂේපිත අයැදුම්පත නැවත සළකා බලන ලෙස ඔබගෙන් කාරුණිකව ඉල්ලා සිටිමි.

2.1. ...................................................................................................................
...................................................................................................................

2.2. ...................................................................................................................
...................................................................................................................

2.3. ...................................................................................................................
...................................................................................................................

03. ඉහත සඳහන් කරුණු සනාථ කිරීම සඳහා පහත සඳහන් ලියවිලි වල සහතික කළ ඡායා පිටපත් මේ සමග යා කර ඇත.

3.1. ...................................................................................................................
3.2. ...................................................................................................................
3.3. ...................................................................................................................

04. මාගේ වාර්ෂික ස්ථාන මාරුව පහත සඳහන් සේවා ස්ථානයකට ලබාදෙන ලෙස ද ඉල්ලමි.

4.1. පළමුවන මනාපය - .....................................................................................
4.2. දෙවන මනාපය - .....................................................................................
4.3. තුන්වන මනාපය - .....................................................................................

දිනය :-................................

...................................
නිලධාරියාගේ අත්සන

---

දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිර්දේශය

සුදුසු අනුප්‍රාප්තිකයෙකු සහිතව /රහිතව නිළධාරියා මුදා හැරිය හැකිය.

දිනය :-...........................

ගරු ආණ්ඩුකාරතුමිය විසින්
2015/10/09... දින
අනුමත කරන ලදී.
ආණ්ඩුකාර ලේකම්

........................................
අත්සන
නම
තනතුර හා නිල මුද්‍රාව